සැ. යු.—2009.08.28 දින පළවූ අංක 1,617 දින දරන ගැසට් පත්‍රයේ IV(අ) කොටස පළ නොවී ය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,618 - 2009 සැප්තැම්බර් මස 03 වැනි බ්‍රහස්පතින්දා - 2009.09.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | 1245 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා භාරගන්නා සියලුම දැන්වීම් *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2009 සැප්තැම්බර් මස 11 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2009 අගෝස්තු මස 28 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2009 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියළුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලුම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ට අභිමත පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබේ.

i. මුළු විභාගයම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසට හෝ පෙනී සිටීම හෝ තහනම් කිරීම.
ii. විභාගයේ එක් විෂයයකට හෝ මුලු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම.
iii. එක් අවුරුදු හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
iv. මුළු ජීවිත කාලයේම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
v. සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම.
vi. විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වග කිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයාගේ පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුරු හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදි වුවත් එවැනි විභාගපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතුවේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටතේ වන්නේය.

1. සියළුම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසළදීත් විභාගශාලාධිපතින්ට ද, ඔහුගේ සහාකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාගශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාගශාලාධිපතින්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය.

3. විභාගයේදී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවුවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුලු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමාවී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සැම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට අවකාශයකි.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන්ම නිශ්ශබ්දව සිටිය යුතුය. මොනම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දි විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීම් ආදියත් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාගශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතුයි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයන්න දැරීමක් ලෙස සළකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමටද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමකැයි සැළකිය හැකිවේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සැම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතුය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතුය. (එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේදී ලියන ලද කියන

9. ගණිත ප්‍රශ්නවලදී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමක් චිත්‍ර කර්මයේදී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සළකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේදි උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැළකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපි ද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොල හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොත් පතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සැම අපේක්ෂකයාම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සළකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොත පතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොලයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම හොර උත්තර ලීවීමට ද, යත්න දැරීම තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සැම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසි යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකුට ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාව යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේදී පිළිතුරු පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත් කෙනෙකුගේ අනන්‍යතා සහතිකයේ වෙනස් කිරීමක් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සළකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය.

i. විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටතේ පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

ii. යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාගශාලාධිපතින්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගපේක්ෂකත්වය අවලංගුවී යාමට හේතු විය හැකිය.

iii. විභාගයට පෙනී සිටීමේදී අපේක්ෂකයන් සැම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේදී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතින්නට දන්වා විභාග අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

iv. විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපි ද්‍රව්‍ය (එනම්, ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේදී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුසණක චක්‍ර සපයන ලද නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

v. විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කුඩු, මකන, රෙදි කෑළි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

vi. තමන් පාවිච්චි කරන සැම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේදී නොපමාව තන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සැම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිය යුතුයි.

vii. උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තිරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

viii. අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

ix. ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව සෑහෙන පමණ විශාලවද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවලදී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවලදීත් ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

x. එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

xi. ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතින්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩිවී සිටිය යුතුය. මෙසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැතිවී යාමටද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවුවකු සේ සලකණු ලැබීමටද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයකුට හෝ බාර නොදිය යුතුය.

xii. යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතින්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විටද කඩදාසි ආදිය අවශ්‍ය වූ විටද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත,

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව

කාලගුණ විද්‍යා නිරීක්ෂක/සන්නිවේදක තනතුර සඳහා ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ පුහුණු කිරීමේ ශ්‍රේණියට බඳවා ගැනීමේ තරග විභාගය - 2009

Competitive Examination for Recruitment of Meterological Observers/Communicators to the Training Grade of the Sri Lanka Technological Service - 2009.

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ පුරප්පාඩුව පවතින ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාලගුණ විද්‍යා නිරීක්ෂක/කාලගුණ විද්‍යා සංනිවේදක තනතුරු සඳහා බඳවා ගැනීමට පහත සඳහන් සුදුසුකම් ලත්, ශ්‍රී ලාංකික ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයෙන්ම අයැදුම්පත් කැඳවනු ලැබේ.

02. විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන තරග විභාගය පදනම් කරගෙන සුදුසු අය තෝරාගනු ලැබේ.

03. මෙම තරග විභාගය විභාග දෙපාර්තමේන්තුව විසින් 2010 ජනවාරි මාසය තුළ උපලේඛන අංක 01 හි දක්වා ඇති නගරවල පිහිටුවනු ලබන විභාග මධ්‍යස්ථානයන්හි දී සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන මාධ්‍යවලින් පවත්වනු ලැබේ. කිසියම් මධ්‍යස්ථානයක් සඳහා ඉල්ලා ඇති අපේක්ෂක සංඛ්‍යාව ප්‍රමාණවත් නොවන බව පෙනී ගියහොත් එම මධ්‍යස්ථාන අවලංගු කොට එකී අපේක්ෂකයන් ආසන්න මධ්‍යස්ථානයකට යොමු කරනු ඇත.

විභාගය පැවැත්වෙන විභාග මධ්‍යස්ථානයන් හා විභාග මධ්‍යස්ථාන අංක උපලේඛනය අංක 01 හි දක්වා ඇත. ඉල්ලුම්පත්‍රයේ අදාළ ශීර්ෂයේ මෙම විභාග මධ්‍යස්ථානයන් හා විභාග මධ්‍යස්ථාන අංක සඳහන් වගුවට අනුව සම්පූර්ණ කළ යුතුය. ඉල්ලුම් කරන මාධ්‍ය හා විභාග මධ්‍යස්ථානය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

04. *සේවයට බඳවා ගැනීමේ ක්‍රමය* :- පුරප්පාඩු සංඛ්‍යාවෙන් 90% ක් බාහිර අයැදුම්කරුවන් සඳහා වෙන් කරන අතර එම තනතුරු රජයේ *ගැසට්* නිවේදනයෙන් හෝ ප්‍රසිද්ධ දැන්වීමක් මගින් අයැදුම්පත් කැඳවා විවෘත තරග විභාගයක් පවත්වනු ලැබේ. ඉන් දක්වන කුසලතාවය අනුව සම්මුඛ පරීක්ෂණයකට භාජනය කිරීමෙන් අනතුරුව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 15/90 හා ඊට සම්බන්ධව නිකුත් කරනු ලැබිය හැකි රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අනුව ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ පුහුණු කිරීමේ ශ්‍රේණියට බඳවා ගැනීම කරනු ලැබේ.

05. *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* :-

05.1 *බාහිර අයැදුම්කරුවන් සඳහා* :- පහත සඳහන් ආකාරයට විෂයයන් 03 කින් අ. පො. ස. (උසස් පෙළ) විභාගය එකවර සමත්වීම

*(අ)* භෞතික විද්‍යාව, ශුද්ධ ගණිතය සහ ව්‍යවහාරික ගණිතය ; හෝ

*(ආ)* භෞතික විද්‍යාව සහ ශුද්ධ ගණිතය හෝ ව්‍යවහාරික ගණිතය හෝ සංයුක්ත ගණිතය සහ පහත සඳහන් විෂයයන් අතරින් එක් විෂයයක් : රසායන විද්‍යාව, සත්ත්ව විද්‍යාව, උද්භිද විද්‍යාව, ජීව විද්‍යාව සහ කෘෂිකර්මය සහ භාෂාව හෝ සාහිත්‍යයත්, ගණිතයත්, විද්‍යාවත් සහ තවත් එක් විෂයකටත් සම්මාන සහිතව විෂයයන් 06 කින් අ. පො. ස. (සා. පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනකදී සමත්වීම

05.2 අයැදුම්පත් භාර ගන්නා අවසන් දිනට අයැදුම්කරුවන් අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45 ට වැඩි නොවිය යුතුය. (දැනටමත් රජයේ හා පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයට මෙම උපරිම වයස් සීමාව බල නොපානු ඇත.)

5..3 අයැදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතුය.

5.4 අයැදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයෙන් යුක්ත විය යුතුය.

5..5 සෑම අයැදුම්කරුවකුම තනතුරට අදාළ සියලු සුදුසුකම් විභාගය සඳහා අයැදුම්පත් භාර ගන්නා අවසන් දින වන විට සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

06. *ඉල්ලුම් කළ යුතු පිළිවෙළ*.- මෙම නිවේදනයේ අගට යොදා ඇති ආදර්ශ ඉල්ලුම්පත්‍රය ප්‍රකාරව ඒ-4 ප්‍රමාණයේ කඩදාසියේ එක් පැත්තක් ප්‍රයෝජනයට ගනිමින් අනුක්‍රමික අංක 01 සිට 04 (ඉ) තෙක් මුල් පිටුවට ඇතුළත් වන පරිදි සකස් කරගත් ඉල්ලුම්පත්‍රය තම අත් අකුරින්ම පිරවිය යුතුය. නිසි ලෙස සම්පූර්ණ කළ අයැදුම්පත් 2009.10.05 දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් "අධ්‍යක්ෂ ජනරාල්, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව, බෞද්ධාලෝක මාවත, කොළඹ 07" යන ලිපිනයට එවිය යුතු අතර අයදුම්පත් බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ "කාලගුණ විද්‍යා නිරීක්ෂක/සංනිවේදක තනතුර" යන්න සඳහන් කළ යුතුය. දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයැදුම්කරුවන් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉල්ලුම්පත්‍ර එවිය යුතුය. ප්‍රමාදවී ලැබෙන හෝ නිසි ලෙස සම්පූර්ණ නොකරන ලද ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලබන අතර ඉල්ලුම්පත් ලැබුණු බව දන්වා එවනු නොලැබේ. ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබාගැනීම ප්‍රායෝජනවත් වනු ඇත. ඉල්ලුම්පත්‍රය පිළියෙල කරගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල ඉල්ලුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ ඉල්ලුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද, යෙදීම අවශ්‍ය වේ.

07. විභාග ප්‍රවේශපත්‍රය, විභාගය පැවැත්වෙන දිනය හා විභාග කාල සටහන විභාග අපේක්ෂකයන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් එවනු ඇත. විභාග අපේක්ෂයන්, විභාග මධ්‍යස්ථානයේ ශාලාධිපති වෙත අත්සන සහතික කරවා ගත් තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය. ප්‍රවේශ පත්‍ර ඉදිරිපත් නොකරනු ලබන කිසිම අයදුම්කරුවෙකුට විභාගයට පෙනීසිටීමට අවසර දෙනු නොලැබේ.

අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍රය නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 02 ක් හෝ 03 ක් ගත වූ පසුවත් ප්‍රවේශපත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුයි. ඔබ වෙත තබා ගත් අයැදුම්පත්‍රයේ හා මුදල් ගෙවූ කුවිතාන්සියේ සහතික කළ ඡායා පිටපත් ද ලියාපදිංචි තැපැල් කුවිතාන්සිය ද කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශපත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක්ද සහිතව ලිපියක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත එවිය යුතුයි. එම ලිපියේ ඡායා පිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

08. ලිඛිත විභාගයේදී අනන්‍යතාව තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ පමණක් පිළිගනු ලැබේ. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

09. මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නියමිත පරිදි ඉල්ලුම්පත් ඉදිරිපත් කර ඇති අයැදුම්කරුවන් හට තරග විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු ලැබේ. තරග විභාගය සඳහා ප්‍රවේශපත්‍රයක් නිකුත් කිරීම අයැදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට වූ පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. ලිඛිත විභාගයේදී ඉහළ ම කුසලතාවක් දක්වා ඇති අයැදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේ අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අය පත්වීම් ලබාදීම සඳහා නුසුදුස්සකු ලෙස සලකනු ලැබේ.

10. මෙම නිවේදනයෙන් අනාවරණය නොවන කරුණු පිළිබඳව හා පත්වීම් ලබාදීමේ අවසාන තීරණ ගැනීමේ බලය කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් සතුය.

11. අයැදුම්පතේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයකු, සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියෙකු, රුපියල් 237,060 කට වැඩි වාර්ෂික වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියකු විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.

12. *විභාග ගාස්තු.*- විභාග ගාස්තු වශයෙන් ආපසු නොගෙවනු ලබන රු. 300 ක මුදලක් කාලගුණ විද්‍යා අධ්‍යක්ෂ ජනරාල් නමට ලංකා බැංකුවේ ටොරින්ටන් චතුරස්‍රය ශාඛාවේ ගිණුම් අංක 70104537042678 යන ගිණුමට බැරකර ඕනෑම ලංකා බැංකු ශාඛාවකට ගෙවා ලබාගත් කුවිතාන්සිය නොගැලවෙන සේ අයැදුම්පත්‍රයට අමුණා එවිය යුතුය. චෙක්පත් භාර ගනු නොලැබේ. මුදල් ගෙවූ කුවිතාන්සියේ ඡායා පිටපතක් ලඟ තබාගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

13. *ලිඛිත විභාගය.*- මෙම තරග විභාගය ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන මාධ්‍යවලින් පවත්වනු ලැබේ. අපේක්ෂකයකු විභාගයේදී පෙනී සිටින සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පිළිතුරු සැපයිය යුතුය. ලිඛිත විභාගය පහත සඳහන් පරිදි ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ.

(1) බුද්ධි පරීක්ෂණය
(2) තාක්ෂණ ප්‍රශ්න පත්‍රය

14. *විෂය නිර්දේශය.*-

(1) *බුද්ධි පරීක්ෂණය.*- කාලය පැය 01 කි. මුළු ලකුණු 100 යි

අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලතාවයත් ඔහුගේ විශ්ලේෂණ තත්ත්වයත් තීරණය කිරීමේ ශක්තියත් විනිශ්චය කිරීම සඳහා වන ප්‍රශ්නවලින් යුක්තය.

(2) තාක්ෂණ ප්‍රශ්න පත්‍රය : කාලය පැය 02 කි. මුළු ලකුණු 100 යි

භෞතික විද්‍යාව විෂයය ආශ්‍රිත අ.පො.ස. (උසස් පෙළ) විභාග මට්ටම හා ඒ දක්වා වූ දැනුම නිශ්චය කෙරේ.

15. *තේරීම් පරිපාටිය.*-

(1) සුදුසුකම් ලැබීම සඳහා එක් එක් විෂයකින් ලකුණු 40% ක් හෝ ඊට වඩා ලබාගත යුතුය. එසේ ලකුණු ලබාගන්නා අපේක්ෂකයින් අතරින් වැඩිම ලකුණු ප්‍රමාණය ලත් අපේක්ෂකයින් සම්මුඛ පරීක්ෂණයකට කැඳවා සුදුසුකම් පරීක්ෂා කර බලනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු දෙනු නොලැබේ. ඉහත 05 යටතේ ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති සහ විභාගයේදී විෂයයන් දෙකෙන්ම උපරිම ලකුණු ගත් අපේක්ෂකයින් තෝරා ඔවුන් පුහුණු කිරීමේ ශ්‍රේණියට පත් කරනු ලැබේ.

(2) ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාවේ සෙසු විධිවිධාන එලෙසම ක්‍රියාත්මක කරමින්, තෝරා ගනු ලබන අය, සේවයේ පළමුවැනි අවුරුදු දහය (10) අඛණ්ඩව උතුරු හා නැගෙනහිර පළාත්වල කලාප කාලගුණ විද්‍යා කාර්යාලවල සේවය කළ යුතුය යන කොන්දේසිය මත, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ කාලගුණ විද්‍යා නිරීක්ෂක පුරප්පාඩු දහයක් (10) පිරවීම සඳහා අමාත්‍ය මණ්ඩලය අනුමැතිය ලබා දී ඇති හෙයින් තෝරා ගැනීමේ දී එවැනි අපේක්ෂකයන්ට පළමු ප්‍රමුඛතාවය ලබා දෙනු ඇත. මෙම ප්‍රමුඛතාවය ලැබෙන්නේ, අපේක්ෂකයන් තම අයැදුම්පත්‍රයේ දක්වන කැමැත්තට අනුවය.

16. *වෛද්‍ය පරීක්ෂණය.*- තෝරාගත් අයැදුම්කරුවන් තමන් ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරික යෝග්‍යතාවයකින් හෙබි බව සනාථ කරනු වස් වෛද්‍ය පරීක්ෂණයකට පෙනීසිටිය යුතු අතර වෛද්‍ය පරීක්ෂණයේදී අයෝග්‍ය බව පෙනී යන අපේක්ෂකයින් නුසුදුස්සන් වනු ඇත.

17. *වැටුප් ක්‍රමය.*- (අංක 6/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය හා ඊට අදාළ සංශෝධනවලට අනුව)

MN 1-2006 - A පුහුණු කිරීමේ ශ්‍රේණිය -

මාසිකව රු. 13,120න් පටන් ගෙන රු. 145 බැගින් වූ වැටුප් වර්ධක 1 කින් ද රු. 13,265 දක්වා වැඩි වන ඒකාබද්ධ වැටුපක් පුහුණු කිරීමේ ශ්‍රේණියට අයත් වේ.

MN3- 2006-A II පන්තියේ ''ආ'' ඛණ්ඩයට, II පන්තියේ, ''අ'' ඛණ්ඩයට, I ශ්‍රේණි සඳහා අදාළ වේ.

රු. 15,005 - 4 x 180 - 6 x 240 - 11 x 320 - 20 x 360 රු. 27,885 (මාසික)

*සටහන.*- පුහුණු කිරීමේ ශ්‍රේණියට බඳවාගනු ලබන අයැදුම්කරුවන් දෙවසරක පුහුණුව අවසානයේ පෙනී සිටිය යුතු යෝග්‍යතා පරීක්ෂණය සමත් වූ විට II වැනි පන්තියේ 'ආ' ඛණ්ඩයට අන්තර්ග්‍රහණය කෙරේ.

18. *සේවා කොන්දේසි.*-

18.1 මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. පත්වීම අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වන අතර තෝරා ගනු ලබන අය වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

18.2 තෝරාගනු ලබන්නන් ආයතන සංග්‍රහයේ ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, දෙපාර්තමේන්තු නියෝග හා රෙගුලාසි හා රජය මගින් දැනට නිකුත් කර ඇති හා කලින් කල නිකුත් කරනු ලබන වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට ද යටත් විය යුතුය.

18.3 රාජ්‍ය භාෂා නොවන භාෂා මාධ්‍යයකින් බඳවාගත් නිලධාරියෙකු පත් කළ දින සිට අවුරුදු 03 ක් ඇතුළත රාජ්‍ය භාෂා පරීක්ෂණයෙන්

සමත්විය යුතුය. නියමිත කාලය තුළ මෙම පරීක්ෂණයෙන් සමත්වීමට අපොහොසත්වීම ඊළඟ වැටුප් වර්ධකය විලම්භනය වීමට හේතු වනු ඇත.

18.4 ස්ථිර පත්වීමේ දින සිට වසර 05 ක් තුළ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 7/2007 ට අනුව දෙවන රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබාගත යුතු අතර, එම ප්‍රවීණතාව ලබා ගැනීමට අපොහොසත් වුවහොත් ප්‍රවීණතාව ලබා ගන්නා තෙක් වැටුප් විලම්භනය වේ.

18.5 1589/30 *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටි රීතිවල සඳහන් බඳවා ගැනීම සඳහා වූ කොන්දේසි අදාළ වේ.

18.6 *විශේෂ.-*

(i) තෝරාගනු ලබන අයදුම්කරුවන් රාජකාරි භාර ගැනීමට පෙර, පුහුණුවෙන් පසු අවුරුදු 05 ක් දෙපාර්තමේන්තුවේ සේවය කරන බවට ද, ඔහු/ඇය එම කාලය දෙපාර්තමේන්තුවේ සේවය කිරීමට අපොහොසත් වුවහොත් රු. 125,000 ක වලංගු මුදලක් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට ගෙවන බවට ද, දෙපාර්තමේන්තුව විසින් පිළිගන්නා වූ ලබන ඇපකරුවන් දෙදෙනෙක් ද ඇතිව බැඳුම්කරයක් ලියා අත්සන් කළ යුතුය.

(ii) රාජකාරි වේලාවන් සෑම විටම සාමාන්‍ය කාර්යාල වේලාවන් නොවන අතර දිවා රාත්‍රී දෙකෙහිම සහ සෙනසුරාදා ඉරිදා සහ රජයේ නිවාඩු, දියත්හි දී, යෙදෙනු ඇත. කෘත්‍ය ලේඛන අනුව ද රාජකාරි කිරීමට සිදු වේ.

(iii) ඔවුන් දිවයිනේ කවර පෙදෙසක වුවද සේවය කළයුතු වේ.

ජී. බී. සමරසිංහ,
අධ්‍යක්ෂ ජනරාල්,
කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව.

2009 සැප්තැම්බර් මස 03 වැනි දින,
කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව,
බෞද්ධාලෝක මාවත,
කොළඹ 07.

**උපලේඛනය අංක 01**

**විභාගය පැවැත්වෙන විභාග මධ්‍යස්ථානයන් හා මධ්‍යස්ථාන අංක**

| *විභාග මධ්‍යස්ථානය* | *මධ්‍යස්ථාන අංක* |
|---|---|
| කොළඹ | 01 |
| මහනුවර | 02 |
| ගාල්ල | 03 |
| කුරුණෑගල | 04 |
| අනුරාධපුරය | 05 |
| රත්නපුර | 06 |
| බදුල්ල | 07 |
| යාපනය | 08 |
| වවුනියාව | 09 |
| මඩකලපුව | 10 |

**කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව**

විභාග අංකය [ ]

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

කාලගුණ විද්‍යා නිරීක්ෂක/සන්නිවේදක තනතුර සඳහා ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ පුහුණු කිරීමේ ශ්‍රේණියට බඳවා ගැනීමේ තරග විභාගය - 2009

Competitive Examination for Recruitment of Meterological Observers/Communicators to the Training Grade of the Sri Lanka Technological Service - 2009.

*විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය
සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4
[ ]
(කොටුව තුළ අදාළ අංකය යොදන්න)

* විභාගයට පෙනී සිටීමට ඉල්ලුම් කරන විභාග මධ්‍යස්ථානය හා මධ්‍යස්ථාන අංක :-
(ගැසට් නිවේදනයේ උපලේඛන අංක 01 බලන්න)

| *විභාග මධ්‍යස්ථානය* | *මධ්‍යස්ථාන අංකය* | |
|---|---|---|
| | | |

(අදාළ මධ්‍යස්ථානය හා මධ්‍යස්ථාන අංකය යොදන්න)

* සේවයේ පළමුවන අවුරුදු දහය (10) අඛණ්ඩව උතුරු හා නැගෙනහිර පළාත්වල කලාප කාලගුණ විද්‍යා කාර්යාලවල සේවය කිරීමට කැමැතිද යන වග

ඔව් - 1
නැත - 2
[ ]
(කොටුව තුළ අදාළ අංකය යොදන්න)

01. *(අ)* මුලකුරු අගට යොදා මුලකුරු සමග නම ඉංග්‍රීසියෙන්
*උදා* : (*Silva* A. B. C.)
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් පිරවිය යුතුයි)

*(ආ)* මුලකුරු අගට යොදා මුලකුරු සමග නම

(සිංහලෙන්/දෙමළෙන්) :.................................................................
.............................................................. මහතා/මෙනවිය/මහත්මිය

*(ඇ)* මුලකුරුවලින් හැඳින්වෙන නම්
(සිංහලෙන්/දෙමළෙන්) :..................................................
.......................................................................................

*(ඈ)* මුලකුරුවලින් හැඳින්වෙන නම් ඉංග්‍රීසියෙන්
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් පිරවිය යුතුයි)

02. ජාතික හැඳුනුම්පත් අංකය

03. ස්ත්‍රී/පුරුෂ භාවය (කොටුව තුළ අදාළ අංකය යොදන්න)
පුරුෂ - 0
ස්ත්‍රී - 1

04. ස්ථිර ලිපිනය :

*(අ)* (සිංහලෙන්/දෙමළෙන්) :.......................................................
.........................................................................................

*(ආ)* ඉංග්‍රීසියෙන් :
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් පිරවිය යුතුයි)
(මෙම ලිපිනයට ප්‍රවේශ පත්‍ර තැපැල් කරනු ඇත)

*(ඇ)* ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :——————.

*(ඈ)* ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :——————.

*(ඉ)* ඔබගේ දුරකථන අංකය :——————.

05. *(අ)* උපන් දිනය : වර්ෂය මාසය දිනය

*(ආ)* 2009.10.05 වැනි දිනට වයස :
අවුරුදු මාස දින

06. විවාහක/අවිවාහක බව
විවාහක - 1
අවිවාහක - 2
(අදාළ අංක කොටුව තුළ ලියන්න)

07. ජන වර්ගය

සිංහල -1, ද්‍රවිඩ - 2, ඉන්දියානු ද්‍රවිඩ - 3, මුස්ලිම් - 4, වෙනත් - 5
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

08. අධ්‍යාපන සුදුසුකම් :

*(අ)* අ.පො.ස. (සා.පෙළ) විභාගය :

පළමුවන වර :
වර්ෂය :
විභාග අංකය :

දෙවන වර :
වර්ෂය :
විභාග අංකය :

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

*(ආ)* අ.පො.ස (උ. පෙළ) විභාගය :

වර්ෂය : විභාග අංකය :

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

09. වෘත්තීය සුදුසුකම්/තාක්ෂණික සුදුසුකම් :

9.1 ලබා ඇති උපාධිය/ඩිප්ලෝමාව :——————.

9.2 අදාළ උපාධිය/ඩිප්ලෝමාව පිරිනමනු ලැබූ ආයතනයේ නම :——————.

9.3 එම උපාධිය/ඩිප්ලෝමාව වලංගු වන දිනය :——————.

10. වෙනත් සුදුසුකම් :——————.

11. ඔබ කිසියම් වරදක් සඳහා උසාවියකින් දඬුවම් ලබා තිබේ ද?
:——————. ඔව්/නැත

11.1 ඔව් නම් විස්තර සඳහන් කරන්න :——————.

12. අයදුම්කරු දැනට රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ රැකියාවක් කරන්නේ නම් තනතුරේ නම, සේවය කරන දෙපාර්තමේන්තුවේ නම සහ ලිපිනය :——————.

13. අයදුම්කරු මීට පෙර රජයේ/පළාත් රාජ්‍ය සේවයේ රැකියාවක් කර ඉවත් වී සිටින අයකු නම් එසේ ඉවත්වීමට හේතුව :——————.

14. විභාග ගාස්තු ගෙවීම පිළිබඳ තොරතුරු :

14.1 විභාග ගාස්තු ගෙවූ බැංකුවේ නම :——————.

14.2 රිසිට්පත් අංකය :——————.

14.3 මුදල් ගෙවූ දිනය :——————.

මුදල් ගෙවූ ලදුපත නොගැලවෙන සේ අමුණන්න (ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබාගන්න)

15. *අයදුම්කරුගේ ප්‍රකාශය :*

මෙම අයදුම්පතේ මා විසින් සපයා ඇති තොරතුරු සියල්ල මාගේ දැනීමේ සහ විශ්වාසය අනුව නිවැරදි සහ සත්‍ය බව ප්‍රකාශ කරමි. මෙම විභාගයේ කොන්දේසි අනුව මා නුසුදුසකු බව අනාවරණය වුවහොත් අපේක්ෂත්වය අවලංගු කිරීමට හෝ පත්වීමක් ලැබීමෙන් පසු ඒ බව අනාවරණය වුවහොත් සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් මම දනිමි. තවද මෙම විභාගය සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් ගනු ලබන තීරණවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

——————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————.

16. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරන.......................................................................................................................... මහතා/මහත්මිය/මෙනවිය මා පෞද්ගලිකව හඳුනන බවත්, ඔහු/ඇය.................................... වැනි දින මා ඉදිරිපිට දී ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

————————, ————————,
අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන. අයදුම්කරුගේ ආදර්ශ අත්සන.

දිනය :—————.
සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :—————.
තනතුර :—————.
ලිපිනය :—————.

(රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ දැනට සේවයේ නියුතු අයදුම්කරුවකු නම් පහත සඳහන් සහතිකය දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් කළ යුතුය.)

රජයේ හෝ පළාත් රාජ්‍ය දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය :

ඉහත තොරතුරු සඳහන්........................................................ මහතා/මහත්මිය/මෙනවිය.................................................................. කාර්යාලයේ සේවය කරන බව ද ඔහු/ඇය....................................................................... දින සිට.................................................................................... තනතුරක සේවය කරන බව ද, ඔහුගේ/ඇයගේ සේවය සතුටුදායක බව ද, මෙම විභාගයේ ප්‍රතිඵල අනුව පත්වීමක් සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය දැනට දරන තනතුරෙන් නිදහස් කරන බව ද /නොකරන බව ද, ඉහත සඳහන් කර ඇති තොරතුරු සත්‍ය බව ද සහතික කරමි.

————————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

දිනය:—————.
සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :—————.
තනතුර :—————.
ලිපිනය :—————.

(මෙය දැනටමත් රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයට පමණක් අදාළ වේ.)

09-102/1

---

## කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව

*විදුලි සංදේශ හා රේඩාර් කාර්මික ශිල්පී තනතුර සඳහා ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ II වැනි පන්තියේ 'ආ' ඛණ්ඩයට බඳවා ගැනීමේ තරග විභාගය - 2009*

## Competitive Examination for the Recruitment of Telecommunication and Radar Technician- Class II Segment B of the Sri Lanka Technological Service - 2009

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ පුරප්පාඩුව පවතින ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ විදුලි සංදේශ හා රේඩාර් කාර්මික ශිල්පී තනතුරු සඳහා බඳවා ගැනීමට පහත සඳහන් සුදුසුකම් ලත්, ශ්‍රී ලාංකික ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයෙන්ම අයදුම්පත් කැඳවනු ලැබේ.

02. විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන තරග විභාගය පදනම් කරගෙන සුදුසු අය තෝරාගනු ලැබේ.

03. මෙම තරග විභාගය විභාග දෙපාර්තමේන්තුව විසින් 2010 ජනවාරි මාසයේ කොළඹ දී සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන මාධ්‍යවලින් පවත්වනු ලැබේ. ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

04. *සේවයට බඳවා ගැනීමේ ක්‍රමය.-* පුරප්පාඩු සංඛ්‍යාවෙන් 90% ක් බාහිර අයදුම්කරුවන් සඳහා වෙන් කරන අතර එම තනතුරු රජයේ ගැසට් නිවේදනයෙන් හෝ ප්‍රසිද්ධ දැන්වීමක් මගින් අයදුම්පත් කැඳවා විවෘත තරග විභාගයක් පවත්වනු ලැබේ. ඉන් දක්වන කුසලතාවය අනුව සම්මුඛ පරීක්ෂණයකට භාජනය කිරීමෙන් අනතුරුව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 15/90 හා ඊට සම්බන්ධව නිකුත් කරනු ලැබිය හැකි රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අනුව ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ II වැනි පන්තියේ "ආ" ඛණ්ඩයට බඳවා ගැනීම කරනු ලැබේ.

05. *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්.-*

5.1 බාහිර අයදුම්කරුවන් සඳහා.-

(i) මොරටුව විශ්ව විද්‍යාලය හෝ හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව (ඉලෙක්ට්‍රොනික් සහ විදුලි සංදේශ සහිතව) ; හෝ
(ii) ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ඉංජිනේරු විද්‍යා ඩිප්ලෝමාව (ඉලෙක්ට්‍රොනික් සහ විදුලි සංදේශ සහිතව) ; හෝ
(iii) උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව (ඉලෙක්ට්‍රොනික් සහ විදුලි සංදේශ සහිතව) ; හෝ
(iv) විවෘත විශ්ව විද්‍යාලයය මගින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව (ඉලෙක්ට්‍රොනික් සහ විදුලි සංදේශ සහිතව) ; හෝ
(v) ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ පළමුවන කොටස සමත්වීමේ සහතිකය (ඉලෙක්ට්‍රොනික් සහ විදුලි සංදේශ සහිතව) ; හෝ
(vi) ඉහත තාක්ෂණික සුදුසුකම්වලට සමාන යයි ශ්‍රී ලංකා තාක්ෂණ සේවා මණ්ඩලය වසින් පිළිගනු ලබන වෙනත් සුදුසුකම්.

සහ

පහත සඳහන් ආකාරයට විෂයයන් 03 කින් අ. පො. ස. (උසස් පෙළ) විභාගය එකවර සමත්වීම

*(අ)* භෞතික විද්‍යාව, ශුද්ධ ගණිතය සහ ව්‍යවහාරික ගණිතය ; හෝ

*(ආ)* භෞතික විද්‍යාව සහ ශුද්ධ ගණිතය හෝ ව්‍යහාරික ගණිතය හෝ සංයුක්ත ගණිතය සහ පහත සඳහන් විෂයයන් අතරින් එක් විෂයයක් ;
රසායන විද්‍යාව, සත්ත්ව විද්‍යාව, උද්භිද විද්‍යාව, ජීව විද්‍යාව ; සහ කෘෂිකර්මය ; සහ
භාෂාව හෝ සාහිත්‍යයත්, ගණිතයත්, විද්‍යාවත් සහ තවත් එක් විෂයකටත් සම්මාන සහිතව විෂයයන් 06 කින් අ.පො.ස. (සා. පෙළ) විභාගය දෙවරකට නොවැඩි ගණනක දී සමත්වීම.

5.2 අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට අයදුම්කරුවන් අවුරුදු 18ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45 ට වැඩි නොවිය යුතුය. (දැනටමත් රජයේ හා පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයට මෙම උපරිම වයස් සීමාව බලනොපානු ඇත).
5.3 අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
5.4 අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයෙන් යුක්ත විය යුතුය.
5.5 සෑම අයදුම්කරුවෙකුම තනතුරට අදාළ සියලු සුදුසුකම් විභාගය සඳහා අයදුම් පත් භාර ගන්නා අවසන් දින වන විට සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

06. *ඉල්ලුම් කළ යුතු පිළිවෙල.-*

මෙම නිවේදනයේ අගට යොදා ඇති ආදර්ශ ඉල්ලුම් පත්‍රය ප්‍රකාරව ඒ -4 ප්‍රමාණයේ කඩදාසියේ එක් පැත්තක් ප්‍රයෝජනයට ගනිමින් අනු අංක 01 සිට 04 (ඉ) තෙක් මුල් පිටුවට ඇතුළත් වන පරිදි සකස් කර ගත් ඉල්ලුම් පත්‍රය තම අත් අකුරින්ම පිරවිය යුතුය. නිසි ලෙස සම්පූර්ණ කළ අයදුම්පත් 2009.10.05 දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් "අධ්‍යක්ෂ ජනරාල්" කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව, බෞද්ධාලෝක මාවත කොළඹ 7" යන ලිපිනයට එවිය යුතු අතර අයදුම්පත් බහා එවන කවරයේ වමත් පස ඉහළ කෙළවරේ "විදුලි සංදේශ හා රේඩාර් කාර්මික ශිල්පී තනතුර" යන්න සඳහන් කළ යුතුය. දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම දෙපාර්තමේන්තු ප්‍රධානිය මගින් ඉල්ලුම්පත්‍ර එවිය යුතුය. ප්‍රමාද වී ලැබෙන හෝ නිසි ලෙස සම්පූර්ණ නොකරන ලද ඉල්ලුම් පත් ප්‍රතික්ෂේප කරනු ලබන අතර ඉල්ලුම්පත් ලැබුණ බව දන්වා එවනු නොලැබේ. ඉල්ලුම් පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. ඉල්ලුම් පත්‍රය පිළියෙල කරගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල ඉල්ලුම් පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ ඉල්ලුම් පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද, යෙදීම අවශ්‍ය වේ.

07. විභාග ප්‍රවේශ පත්‍රය, විභාගය පැවැත්වෙන දිනය හා විභාග කාල සටහන විභාග අපේක්ෂකයන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් එවනු ඇත. විභාග අපේක්ෂයන්, විභාග මධ්‍යස්ථානයේ ශාලාධිපති වෙත අත්සන සහතික කරවා ගත් තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය. ප්‍රවේශ පත්‍ර ඉදිරිපත් නොකරනු ලබන කිසිම අයදුම්කරුවෙකුට විභාගයට පෙනීසිටීමට අවසර දෙනු නොලැබේ.

අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 02 ක් හෝ 03 ක් ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුයි. ඔබ වෙත තබා ගත් අයදුම් පත්‍රයේ හා මුදල් ගෙවූ කුවිතාන්සියේ සහතික කළ ඡායා පිටපත් ද ලියාපදිංචි කළ කුවිතාන්සිය ද කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශ පත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක් ද සහිතව ලිපියක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත එවිය යුතුයි. එම ලිපියේ ඡායා පිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

08. ලිඛිත විභාගයේදී අනන්‍යතාව තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ පමණක් පිළිගනු ලැබේ. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

09. මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නියමිත පරිදි ඉල්ලුම්පත් ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන් හට තරග විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු ලැබේ. තරග විභාග සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට වූ පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. ලිඛිත විභාගයේදී ඉහළ ම කුසලතාවයක් දක්වා ඇති අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේ අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අය පත්වීම් ලබාදීම සඳහා නුසුදුසුස්සකු ලෙස සලකනු ලැබේ.

10. මෙම නිවේදනයෙන් අනාවරණය නොවන කරුණු පිළිබඳව හා පත්වීම් ලබාදීමේ අවසාන තීරණ ගැනීමේ බලය කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් සතුය.

11. අයදුම්පතේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියෙකු, රුපියල් 237,060 කට වැඩි වාර්ෂික වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.

12. *විභාග ගාස්තු.-* විභාග ගාස්තු වශයෙන් ආපසු නොගෙවනු ලබන රු. 300 ක මුදලක් කාලගුණ විද්‍යා අධ්‍යක්ෂ ජනරාල් නමට ලංකා බැංකුවේ ටොරින්ටන් චතුරස්‍රය ශාඛාවේ ගිණුම් අංක 70104537042678 යන ගිණුමට බැරකර ඕනෑම ලංකා බැංකු ශාඛාවකට ගෙවා ලබාගත් කුවිතාන්සිය නොගැලවෙනසේ අයදුම්පත්‍රයට අමුණා එවිය යුතුය. චෙක්පත් භාර ගනු නොලැබේ. මුදල් ගෙවූ කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

13. *ලිඛිත විභාගය.-* මෙම තරග විභාගය ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් සිංහල දෙමළ සහ ඉංග්‍රීසි යන මාධ්‍යවලින් පවත්වනු ලැබේ. අපේක්ෂකයෙකු විභාගයේදී පෙනී සිටින සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පිළිතුරු සැපයිය යුතුය. ලිඛිත විභාගය පහත සඳහන් පරිදි ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ :

(1) බුද්ධි පරීක්ෂණය
(2) තාක්ෂණ ප්‍රශ්න පත්‍රය

14. *විෂයය නිර්දේශය.-*

(1) බුද්ධි පරීක්ෂණය : කාලය පැය 01 කි. මුළු ලකුණු 100 යි

අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලතාවයත් ඔහුගේ විශ්ලේෂණ තත්ත්වයත් තීරණය කිරීමේ ශක්තියත් විනිශ්චය කිරීම සඳහා වන ප්‍රශ්නවලින් යුක්තය.

(2) තාක්ෂණ ප්‍රශ්න පත්‍රය : කාලය පැය 02 කි. මුළු ලකුණු 100 යි

භෞතික විද්‍යාව සහ ඉලෙක්ට්‍රොනික විද්‍යාව විෂයයන්ට අදාළව අ. පො. ස. (උසස් පෙළ) විභාග මට්ටම හා ඒ දක්වා වූ විද්‍යුත් මූලධර්ම, අර්ධ සන්නායක, ඩිජිටල් තාක්ෂණය, විවිධ සන්නිවේදන සහ දත්ත හුවමාරු ක්‍රම පිළිබඳව අපේක්ෂකයාගේ දැනුම විනිශ්චය කිරීම සඳහා වන ප්‍රශ්නවලින් යුක්තය.

15. *තේරීම් පරිපාටිය.-*

සුදුසුකම් ලැබීම සඳහා එක් එක් විෂයකින් ලකුණු 40% ක් හෝ ඊට වඩා ලබාගත යුතුය. එසේ ලකුණු ලබාගන්නා අපේක්ෂකයින් අතරින් වැඩිම ලකුණු ප්‍රමාණය ලත් අපේක්ෂකයින් සම්මුඛ පරීක්ෂණයකට කැඳවා සුදුසුකම් පරීක්ෂා කර බලනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු දෙනු නොලැබේ. ඉහත 05 යටතේ ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති සහ විභාගයේදී විෂයයන් දෙකෙන්ම උපරිම ලකුණු ගත් අපේක්ෂකයින් තෝරා ඔවුන් පුහුණු කිරීමේ ශ්‍රේණියට පත් කරනු ලැබේ.

16. *වෛද්‍ය පරීක්ෂණය.-* තෝරාගත් අයදුම්කරුවන් තමන් ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරික යෝග්‍යතාවයකින් හෙබි බව සනාථ කරනුවස් වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර වෛද්‍ය පරීක්ෂණයේදී අයෝග්‍ය බව පෙනී යන අපේක්ෂකයින් නුසුදුස්සන් වනු ඇත.

17. *වැටුප් ක්‍රමය.-* (අංක 6/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය හා ඊට අදාළ සංශෝධනවලට අනුව)

MN3- 2006-A-II පන්තියේ ''ආ'' ඛණ්ඩයට, II පන්තියේ, ''අ'' ඛණ්ඩයට, I ශ්‍රේණි සඳහා අදාළ වේ.

රු. 15,005 - 4 x 180 - 6 x 240 - 11 x 320 - 20 x 360 -රු. 27,885 (මාසික)

18. *සේවා කොන්දේසි :-*

18.1 මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. පත්වීම අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වන අතර තෝරා ගනු ලබන අය වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

18.2 තෝරාගනු ලබන්නන් ආයතන සංග්‍රහයේ ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, දෙපාර්තමේන්තු නියෝග හා රෙගුලාසි හා රජය මගින් දැනට නිකුත් කර ඇති හා කලින් කල කරනු ලබන වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට ද යටත් විය යුතුය.

18.3 රාජ්‍ය භාෂා නොවන භාෂා මාධ්‍යයකින් බඳවාගත් නිලධාරියෙකු පත් කළ දින සිට අවුරුදු 03 ක් ඇතුළත රාජ්‍ය භාෂා පරීක්ෂණයෙන් සමත්විය යුතුය. නියමිත කාලය තුළ මෙම පරීක්ෂණයෙන් සමත්වීමට අපොහොසත්වීම ඊළඟ වැටුප් වර්ධකය විලම්භනය වීමට හේතු වනු ඇත.

18.4 ස්ථිර පත්වීමේ දින සිට වසර 05 ක් තුළ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 7/2007 ට අනුව දෙවන රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබාගත යුතු අතර, එම ප්‍රවීණතාව ලබා ගැනීමට අපොහොසත් වුවහොත් ප්‍රවීණතාව ලබා ගන්නා තෙක් වැටුප් විලම්භනය වේ.

18.5 1589/30 *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටි රීතිවල සඳහන් බඳවා ගැනීම සඳහා වූ කොන්දේසි අදාළ වේ.

18.6 විශේෂ :-

(i) රාජකාරි වේලාවන් සෑම විටම සාමාන්‍ය කාර්යාල වේලාවන් නොවන අතර දිවා රාත්‍රී දෙකෙහිම සහ සෙනසුරාදා ඉරිදා සහ රජයේ නිවාඩු, දිනයන්හි ද යෙදෙනු ඇත. කෘත්‍ය ලේඛන අනුව ද රාජකාරි කිරීමට සිදු වේ.

(ii) ඔවුන් දිවයිනේ කවර පෙදෙසක වුවද සේවය කළයුතු වේ.

ජී. බී. සමරසිංහ,
අධ්‍යක්ෂ ජනරාල්,
කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව.

2009 සැප්තැම්බර් 03 වැනි දින,
කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව,
බෞද්ධාලෝක මාවත,
කොළඹ 07.

**කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව**

විභාග අංකය [ ]

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

විදුලි සංදේශ හා රේඩාර් කාර්මික ශිල්පී තනතුර සඳහා ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ II වන පන්තියේ "ආ" ඛණ්ඩයට බඳවා ගැනීමේ තරග විභාගය - 2009

Competitive Examination for the Recruitment of Telecommunication & Radar Technician - Class II Segment B of the Sri Lanka Technological Service - 2009.

*විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය : සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4
(කොටුව තුළ අදාළ අංකය යොදන්න)

01. *(අ)* මුලකුරු අගට යොදා මුලකුරු සමග නම ඉංග්‍රීසියෙන් :
උදා : (Silva A. B. C.)
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් පිරවිය යුතුයි)

*(ආ)* මුලකුරු අගට යොදා මුලකුරු සමග නම :

(සිංහලෙන්/දෙමළෙන්) :........................................................................
.............................................................. මහතා/මෙනවිය/මහත්මිය

*(ඇ)* මුලකුරුවලින් හැඳින්වෙන නම් :
(සිංහලෙන්/දෙමළෙන්) :........................................................
..........................................................................................

*(ඈ)* මුලකුරුවලින් හැඳින්වෙන නම් ඉංග්‍රීසියෙන් :
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් පිරවිය යුතුයි)

02. ජාතික හැඳුනුම්පත් අංකය :

03. ස්ත්‍රී/පුරුෂ භාවය : [ ] (කොටුව තුළ අදාළ අංකය යොදන්න)
පුරුෂ - 0
ස්ත්‍රී - 1

04. ස්ථිර ලිපිනය :
*(අ)* (සිංහලෙන්/දෙමළෙන්) :........................................................
..........................................................................................

*(ආ)* ඉංග්‍රීසියෙන් :
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් පිරවිය යුතුයි)
(මෙම ලිපිනයට ප්‍රවේශ පත්‍ර තැපැල් කරනු ඇත)

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |

*(ඇ)* ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :—————.
*(ඈ)* ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :—————.
*(ඉ)* ඔබගේ දුරකථන අංකය :—————.

05. *(අ)* උපන් දිනය : වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

*(ආ)* 2009.10.05 වැනි දිනට වයස :
අවුරුදු ☐☐ මාස ☐☐ දින ☐☐

06. විවාහක/අවිවාහක බව : ☐ විවාහක -1
අවිවාහක -2
(අදාළ අංක කොටුව තුළ ලියන්න)

07. ජන වර්ගය : ☐

සිංහල -1, ද්‍රවිඩ - 2, ඉන්දියානු ද්‍රවිඩ - 3, මුස්ලිම් - 4, වෙනත් - 5
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

08. *අධ්‍යාපන සුදුසුකම් :*

*(අ)* අ.පො.ස. (සා.පෙළ) විභාගය :

| පළමුවන වර : | දෙවන වර : |
|---|---|
| වර්ෂය : | වර්ෂය : |
| විභාග අංකය : | විභාග අංකය : |

| *විෂයය* | *සාමාර්ථ්‍යය* | *විෂයය* | *සාමාර්ථ්‍යය* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

*(ආ)* අ.පො.ස (උ. පෙළ) විභාගය :

වර්ෂය : විභාග අංකය :

| *විෂයය* | *සාමාර්ථ්‍යය* | *විෂයය* | *සාමාර්ථ්‍යය* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

09. *වෘත්තීය සුදුසුකම්/තාක්ෂණික සුදුසුකම් :*

9.1 ලබා ඇති උපාධිය/ඩිප්ලෝමාව :—————.
9.2 අදාළ උපාධිය/ඩිප්ලෝමාව පිරිනමනු ලැබූ ආයතනයේ නම :—————.
9.3 එම උපාධිය/ඩිප්ලෝමාව වලංගු වන දිනය :—————.

10. වෙනත් සුදුසුකම් :—————.

11. ඔබ කිසියම් වරදක් සඳහා උසාවියකින් දඬුවම් ලබා තිබේ ද?
:—————. ඔව්/නැත

11.1 ඔව් නම් විස්තර සඳහන් කරන්න :—————.

12. අයදුම්කරු දැනට රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ රැකියාවක් කරන්නේ නම් තනතුරේ නම, සේවය කරන දෙපාර්තමේන්තුවේ නම සහ ලිපිනය :—————.

13. අයදුම්කරු මීට පෙර රජයේ/පළාත් රාජ්‍ය සේවයේ රැකියාවක් කර ඉවත් වී සිටින අයකු නම් එසේ ඉවත්වීමට හේතුව :—————.

14. *විභාග ගාස්තු ගෙවීම පිළිබඳ තොරතුරු :*

14.1 විභාග ගාස්තු ගෙවූ බැංකුවේ නම :—————.
14.2 රිසිට්පත් අංකය :—————.
14.3 මුදල් ගෙවූ දිනය :—————.

මුදල් ගෙවූ ලදුපත නොගැලවෙන සේ අමුණන්න (ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබාගන්න)

15. *අයදුම්කරුගේ ප්‍රකාශය :*

මෙම අයදුම්පතේ මා විසින් සපයා ඇති තොරතුරු සියල්ල මාගේ දැනීමේ සහ විශ්වාසය අනුව නිවැරදි සහ සත්‍ය බව ප්‍රකාශ කරමි. මෙම විභාගයේ කොන්දේසි අනුව මා නුසුදුස්සකු බව අනාවරණය වුවහොත් අපේක්ෂත්වය අවලංගු කිරීමට හෝ පත්වීමක් ලැබීමෙන් පසු ඒ බව අනාවරණය වුවහොත් සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් මම දනිමි. තව ද, මෙම විභාගය සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් ගනු ලබන තීරණවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

:—————,
අයදුම්කරුගේ අත්සන

දිනය :—————.

16. *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :*

මෙම අයදුම්පත ඉදිරිපත් කරන................................................................................ ..................................................... මහතා/මහත්මිය/මෙනවිය මා පෞද්ගලිකව හඳුනන බවත්, ඔහු/ඇය..................................... වැනි දින මා ඉදිරිපිට දී ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

————————, ————————,
අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන　　අයදුම්කරුගේ ආදර්ශ අත්සන

දිනය :——————;
සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :——————;
තනතුර :——————;
ලිපිනය :——————.

(රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ දැනට සේවයේ නියුතු අයදුම්කරුවකු නම් පහත සඳහන් සහතිකය දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් කළ යුතුය.)

**දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය**

ඉහත තොරතුරු සඳහන්..............................................මහතා/මහත්මිය/මෙනවිය ................................................ කාර්යාලයේ සේවය කරන බව ද ඔහු/ඇය....................... දින සිට.. තනතුරක සේවය කරන බව ද, ඔහුගේ/ඇයගේ සේවය සතුටුදායක බව ද, මෙම විභාගයේ ප්‍රතිඵල අනුව පත්වීමක් සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය දැනට දරන තනතුරෙන් නිදහස් කරන බව /නොකරන බව ද, ඉහත සඳහන් කර ඇති තොරතුරු සත්‍ය බව ද සහතික කරමි.

————————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

දිනය:——————;
සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :——————;
තනතුර :——————;
ලිපිනය :——————.

09-102/2

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
## සංශෝධිත ගාස්තු

2009 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2009 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | | | | රු. ශ. |
|---|---|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... | ... | ... | ... | 137 00 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට | ... | ... | ... | 137 00 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට | ... | ... | ... | 1,300 00 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට | ... | ... | ... | 2,600 00 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ ගැසට් පත්‍රයේ සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. **2009 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව'-**

### * ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | වාර්ෂික දායක මුදල රු. ශ. | තැපැල් ගාස්තුව රු. ශ. |
|---|---|---|
| I වැනි කොටස ፡ | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 2,080 00 | 3,120 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 1,300 00 | 3,120 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 780 00 | 3,120 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... ... | 4,160 00 | 6,240 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... | 580 00 | 3,120 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... | 405 00 | 3,120 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 890 00 | 2,400 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 860 00 | 420 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 260 00 | 180 00 |
| අති විශෙෂ ගැසට් පත්‍රය ... ... ... ... ... ... ... ... | 5,145 00 | 5,520 00 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | පිටපතක මිළ රු. ශ. | තැපැල් ගාස්තුව රු. ශ. |
|---|---|---|
| I වැනි කොටස ፡ | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 00 | 60 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 00 | 60 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 00 | 60 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 00 | 120 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 00 | 60 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 00 | 60 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 00 | 60 00 |

* කොළඹ 05, කිරුළපන, මායා මාවතේ, අංක 132 හි ප්‍රකාශන කාර්යාංශයේ තනිපිටපත් විකිණීම සහ දායක මුදල් භාර ගැනීමේ අධිකාරී වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙනන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවාත් හැර එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා රජයේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියලු ම දායක මුදල් කොළඹ 05, කිරුළපන, මායා මාවතේ අංක 132 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැළකිය යුතුයි.*** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත නොව රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | **2009** | | | | | |
| සැප්තැම්බර් | 2009.09.03 | බ්‍රහස්පතින්දා | 2009.08.21 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2009.09.11 | සිකුරාදා | 2009.08.28 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2009.09.18 | සිකුරාදා | 2009.09.03 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2009.09.25 | සිකුරාදා | 2009.09.11 | සිකුරාදා | දහවල් | 12.00 |
| ඔක්තෝබර් | 2009.10.02 | සිකුරාදා | 2009.09.18 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2009.10.09 | සිකුරාදා | 2009.09.25 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2009.10.16 | සිකුරාදා | 2009.10.02 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2009.10.23 | සිකුරාදා | 2009.10.09 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2009.10.30 | සිකුරාදා | 2009.10.16 | සිකුරාදා | දහවල් | 12.00 |
| නොවැම්බර් | 2009.11.06 | සිකුරාදා | 2009.10.23 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2009.11.13 | සිකුරාදා | 2009.10.30 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2009.11.20 | සිකුරාදා | 2009.11.06 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2009.11.27 | සිකුරාදා | 2009.11.13 | සිකුරාදා | දහවල් | 12.00 |

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2009 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.